# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය SINHALA

India's National Spiritual Newspaper ₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XX YEAR OF OUR LORD JESUS CHRIST, 2026 FEBRUARY Issue No. 03


## ශුද්ධවූ බයිබලය

(ගීතාවලිය 34:15-22)

15. ස්වාමින්ගේ ඇස් ධර්මිෂ්ඨයන් දෙසටත් උන්වහන්සේගේ කන් ඔවුන්ගේ මොරගැසීමටත් යොමා තිබේ,

16. නපුරුකම් කරන්නන් ගැන සිහිවීම පොළොවෙන් සිඳ දමන පිණිස ස්වාමින්ගේ මුහුණ ඔවුන්ට විරුද්ධවේ.

17. ධර්මිෂ්ඨයෝ මොරගසුවෝය, ස්වාමින්වහන්සේ අසා ඔවුන්ගේ සියලු දුක්වලින් ඔවුන් ගැළවූසේක.

18. ස්වාමින්වහන්සේ බිඳුණු සිත් ඇත්තන්ට ළංව සිටිනසේක. තැළුණු ආත්ම ඇත්තන් ගලවනසේක.

19. ධර්මිෂ්ඨයාගේ පීඩා බොහෝය. නුමුත් ස්වාමින්වහන්සේ ඒ සියල්ලෙන් ඔහු ගලවනසේක.

20. උන්වහන්සේ ඔහුගේ ඇට සියල්ල ආරක්ෂාකරනසේක. එයින් එකක්වත් නොබිඳේ.

21. නපුර දුෂ්ටයා නසන්නේය. ධර්මිෂ්ඨයාට ද්වේෂකරන්නෝ වරදට පත්කරනු ලබන්නෝය.

22. ස්වාමින්වහන්සේ ස්වකීය මෙහෙකරුවන්ගේ ආත්මය මුදනසේක. උන්වහන්සේ කෙරෙහි විශ්වාසකරන කිසිවෙක්වත් වරදට පත්කරනු නොලබන්නේය.

## ඔබේ සම්පූර්ණ යටත් වීම ඔබට ආශිර්වාදයේ බහුලත්වය ගෙන දෙයි !

## YOUR COMPLETE SURRENDER WILL LEAD TO ABUNDANT BLESSINGS!

### Sis. Angelin





ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් ඔබ සැමට ආසිරි පතමි. මෙම නව වසරේ ඔබ සැම දෙනාටම ඉතා බලවත් ආරම්භයක් සහ අසිරිමත් ජනවාරි මාසයක් තිබෙන්න ඇතැයි කියා මා විශ්වාස කරමි. එසේම 2026 ජනවාරි මාසය ඔබට විවිධාකාර අභියෝගයන් තිබූ මාසයක් වන්නට ඇත. මගේ යාච්ඤාව නම්; දෙවියන්වහන්සේගේ සමාදානය, කරුණාව සහ දේව බලය ඔබගේ ජීවිතයේ සහ ඔබගේ ගමන තුළ දිගටම තිබෙන්නේ කියාය.



හොඳ ආරම්භය ඉතා වැදගත්ය. ඊටත් වඩා වැදගත් දෙය නම් අප ආරම්භ කළ කාර්ය නිමා කරන්නේ කෙසේද කියාය. දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළින් ඔබට උපකාර කරමින් 2026 වසර නිමාවේදී ඔබ ඵලදරුවා වූ ජයග්‍රාහී කැනැත්තෙක් වෙන්නය කියා මා යාච්ඤා කරමි. ඔබගේ ආරම්භයට වඩා මේ වසර අවසානය ඔබට බලවත් ආශිර්වාද ගෙන දෙයි කියා මා විශ්වාස කරමි.

### හොඳින් ආරම්භ කළ රජෙක් හොඳින් නිමා කලේ නැත.

මෙම සත්‍යතාවය මට මතක් කර දෙන්නේ අමසියා රජතුමා ගැනය. ඔහු ඉතා බලසම්පන්නව හොඳින් ආරම්භ කළ නමුත් ඔහුගේ අවසානය

3 වෙනි පිටුව ...




Echo of His Call

Christian YouTube Channel!

Every day 2 minutes message by

Pr. S. Sam Selva Raj!

in English, Hindi, Tamil & Telugu

and

Tamil & English Message & Prayer

Sunday 8.30 A.M. & 6.00 P.M.

★ Please Subscribe and Share ★

1969 TO 2029 ECHO OF HIS CALL SINCE 1969

ECHO OF HIS CALL - (Marching towards 60th year)
Estd. 1969



# from your dearly beloved brother...



## OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Dr. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
EX MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM, MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858
95661 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.org
YOUTUBE CHANNEL
Echo of His Call

".....ස්වාමීන් වහන්සේ නුඹ වල්ගය නොව හිස වෙනට සලස්වනවා ඇත....."
- (ද්විතීය කතාව 28:14)

ස්වාමීන් වහන්සේ තුළ ප්‍රේමවන්තයෙනි,

අපගේ ස්වාමි වූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අනර්ඝ වූ නාමයෙන් අප ඔබට සුබ පැතුම් ගෙනෙමි!

පසුගිය මාසයේදී ස්වාමීන්වහන්සේ අපගේ සියළුම සේවාවන්වලට ආශීර්වාදය ලබාදුන්සේක. මෙම වර්ෂයේ පළමු මාසය පටන් ගැන්මෙහිදී නවත් ජිවන සේවාවන් කිරීමට විවිධ ස්ථානයන්ද ධර්මදූත සේවය සඳහා ස්ථානයන්ද අපට විවෘත වි තිබේ.

වෛද්‍ය පී.ඊ.ආර්. ප්‍රේමචාන්ඩ්, අපගේ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලේ නත්තල් වැඩසටහනට සහභාගී වි දේව වචනය බෙදා ගන්නා ලදි. ඔහු අපගේ ලේකම්



*Christmas function at St. Paul's Matriculation School*

ලෙස ද සේවයෙහි යෙදී සිටියි. එසේම දෙසැම්බර් මාසයේදී අපගේ සහෝදරියා බයිබල් විද්‍යාලෙහි ළමුන් සහ අපගේ සභාවේ ඇදහිලිවන්තයින් කිපදෙනෙක් සමඟ අප බොහෝ සේවාවන්වල යෙදී සිටියෙමු.

තවද පසුගිය වසරේ You Tube නාලිකාව හරහා පවත්වාගෙන පැමිණි සේවාවන් තුලින් මහත් බලවත් වර්ධනයක් ලැබුවේය. මුළු ලෝකයෙම විවිධ ස්ථානවල සිටින අය විකාශනය කරනු ලබන මෙම පණිවිඩය තුලින් ආශිර්වාද ලැබූ බව අපට දැනවුවේය. එසේම ඉතා උද්‍යෝගයෙන් පහතව විශ්වාසවන්තව සේවය කරන අපගේ සේවක මඩුල්ල උදෙසා ද යාච්ඤා කරන්නය කියා අප ඔබගෙන් ඉල්ලා සිටිමු.

අපගේ සභාවේ හිංදි භාෂාවෙන් කතා කරන්නාවූ සියලුම ඇදහිලි වන්තයින් උදෙසා හිංදි භාෂාවෙන් දේව මෙහෙයක් පවත්වන්නෙමු. එසේම සෑම මිදාදා දිනකම සවස 7.00



*YouTube Ministry Team*

ට හිංදි භාෂාවෙන් යාච්ඤාවක්ද පවත්වමු. මේ උදෙසාද යාච්ඤා කරන්න. අපගේ කාර්යාලයෙහි සේවය කරන බොහෝ දෙනෙක් නොයෙකුත් අභියෝග මැද සේවය කරමින් සිටිති.

මෙම වසර පුරා ඔවුන් ශක්තිමත්ව සේවය කරන පිණිසත් බලවත් ලෙස ඔවුන්ගේ ජිවිතවලට ආශිර්වාදය ලැබෙන පිණිසත් යාච්ඤා කරන්න. ස්වාමීන්වහන්සේගේ කරුණාව ඔබ සෑම දෙනා සමග පවතිවා..... ආමෙන්.....

*In Christ Jesus, your servant,* **Pr. S. Sam Selva Raj**

E.mail : sam@echoofhiscall.org

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) YouTube Ministry Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development

1 පිටුවෙන්....

ඉතාම දුක් සහිතය. මේ දේ සිදුවුණේ ඇයි කියා දේව වචනය මෙසේ සඳහන් කරයිඃ

*"ඔහු ස්වාමීන් වහන්සේගේ ඇස් හමුයෙහි හරිව තිබුණු දේ කෙළේය. නුමුත් සම්පූර්ණ සිතකින් නොවේය."* *(2 ලේකම් 25:2)*

## මෙම අමශියා කවුද?



අමශියා යෝවාෂ්ගේ පුතුයෙක්ය. ඔහු අවුරුදු හතේදී රජවිය. ඔහුට යුදයෙහි 9 වෙනි රජතුමාය. ඔහුගේ ජීවිත කතාව ගැන සඳහන් වී ඇත්තේ 2 රාජාවලිය 14 සහ 2 ලේකම් 25 වන පරිච්ඡේදයන්හිය.

දේව වචනය තුළින් ඔහු ගැන අපට සිතන්නට ඉතා වැදගත් කාරණයක් දී තිබේ. ඔහු දෙවියන්වහන්සේ ඉදිරියෙහි හරි දේ කළ නමුත් සම්පූර්ණ සිතකින් එය කළේ නැත.

### දෙවියන්වහන්සේට සම්පූර්ණ සිතකින් සේවය නොකරනවා යනු කුමක්ද?

දෙවියන්වහන්සේ ඉදිරියෙහි අපට හරි දේ කිරීමට පුළුවනි. නමුත් ඒ දේ අප සම්පූර්ණ යටත් කමින් කරනවාද?

අපගේ හදවතෙහි දෙසිතක් ඇතිව පිටස්තරයෙන් අන් අයට පෙනෙන්නට දෙවියන් වහන්සේට සේවය කරන්නට පුළුවන්ද?

දේව වචනයෙහි අමශියා පිළිබඳව පවසා තිබෙන පරිදි ඔහු ඉතාම අවාසනාවන්ත රජෙකි. ඔහු නපුරු පුද්ගලයෙක් නොවෙයි. ඔහු යම්කිසි තරමකට යහපත් කෙනෙක්ය. ඔහු මුළුමනින්ම කීකරු නොවූ අතර මුළු හදවතින් කීකරු වූයේද නැත. ඔහු කීකරුව ඔහු හොඳ දේ කළා.

දෙවියන්වහන්සේගේ අණ ඔහු අනුගමනය කළේය.

එහෙත් ඔහු ඔහුගේ මුළු හදවතින්ම දෙවියන්වහන්සේට යටත් වී සිටියේ නැත. මෙය අමශියාගේ කතාව පමණක් නොව බොහෝ ඇදහිලිවන්තයින්ගේ ජීවිතවලත් සිදුවන්නේ මේ ආකාරයෙනි. අප දෙවියන් වහන්සේට ප්‍රේම කරන්නෙමු. උන්වහන්සේව අනුගමනය කරන්නෙමු. එහෙත් අපගේ ජීවිතවල සමහර ස්ථාන උන්වහන්සේට සම්පූර්ණයෙන්ම කැප නොකළා වූ දේ ඇත.

සමහර විට අපිඃ

සභාවට සහභාගී වෙමු

විශ්වාසවන්තව සේවය කරන්නෙමු

සමාජයට යහපත් සේවයක් කරමු

අවශ්‍ය කරන අයට උපකාර කරමු

බොහෝ අවස්ථාවන්වලදී අප කීකරු වෙමු

නමුත් ඉතාමත් වැදගත් ප්‍රශ්නය වන්නේ දෙවියන්වහන්සේ ඉදිරියෙහි අපගේ හදවත තිබෙන්නේ කුමන ස්ථානයේද?

මගේ පියා නිතරම පවසන දේ නම්, අප කිසියම් දෙයකට පමණක් කීකරු වෙනවා නම්, එනම් අප සම්පූර්ණයෙන්ම අකීකරු වෙනවා කියාය.

මෙම නව වසර ආරම්භයේදී අප ඇසිය යුතු ප්‍රශ්නය නම්; 2026 වර්ෂය අපට හොඳින් නිමා කිරීමට අවශ්‍ය නම් මම කරන හැමදේම අවංක හදවතකින් කරනවාද? යන්නයි.

## අමශියාගේ ජීවිතයෙන් අපට ඉගෙන ගත හැකි පාඩම!





*Amaziah began well but, he did not finish well*



යුදය සහ ඊශ්‍රායලය පාලනය කළා වූ රජවරුන්ගේ ජීවිත කතාවන් ගැන මා මෙනෙහි කිරීමට ඉතා සතුටුවෙමි. ඔවුන්ගේ ජීවිත කතාව අපගේ ජීවිතයට කැඩපතක් මෙන්ය. එයින් අපට යම් යම් පාඩම් උගන්වයි. අමශියා ඉතා හොඳින් පටන් ගත් නමුත් කොතනදී හෝ ඔහුට වැරදුණේය. එමනිසා බොහෝ දේ වලට ඔහුට මුහුණ දීමට සිදුවිය.

# [1]. කැපවීම

## අමශියා හොඳින් පටන් ගත්තා!

(2 ලේකම් 25:1-10)

"ඔහු ස්වාමීන් වහන්සේගේ ඇස් හමු යෙහි හරිව තිබුණු දේ කෙළේය. නමුත් තමාගේ පිය වූ දාවිත් මෙන් නොවේය. තමාගේ පියවූ යෝවාෂ් කල සියල්ල ලෙස ඔහු කෙළේය." (2 රාජාවලියක් 14:3)



***Amaziah followed the example of his father Joash, but not as King David***

### A. දෙවියන් වහන්සේගේ වචනයට කීකරුවීම සහ ධර්මිෂ්ඨකම!

අමශියා රජකමට පැමිණි විට ඔහුගේ පියා මැරූ අයට විරුද්ධව ඔහු නීතිය ක්‍රියාත්මක කළේය. නමුත් ඔහු පියාව මැරූ අයගේ දරුවන්ට කිසිවක් කළේ නැත. ඔහු දෙවියන් වහන්සේගේ නීතියට කීකරු විය. දේව වචනයෙහි මෙසේ පවසයි;

*"දරුවන් වෙනුවට පියවරුවත් පියවරුන් වෙනුවට දරුවෝවත් මරණු නොලැබෙත්වා. එක්කෙනා තම තමාගේ පාපය නිසා මරණු ලැබේවා." (ද්විතීය කතාව 24:16)*

*"නුමුත් දරුවන් නිසා පියවරුන්වත් පියවරුන් නිසා දරුවෝවත් වත් මරණු නොලබත්වා එක එකා තම තමාගේ පාපය නිසා මරණු ලබාවායි කියා ..........." (2 රාජාවලිය 14:6)*

අතලියා රැජිණිය කලාක් මෙන්;
(2 රාජාවලිය 11:1) එනම් ඇය රාජ වංශයේ දරුවන් සියල්ලන්ම විනාශ කළාය. නමුත් අමශියා දෙවියන් වහන්සේගේ හඬට ගරු කළ අතර ඔහු හොඳින් ආරම්භ කළේය.

### B. පුද්ගලික ලෙස පාඩු සිදු වුවත් ඔහු කීකරු විය.

අමශියා විශාල මුදලක් වැය කරමින් ඊශ්‍රායලයෙන් සොල්දාදුවන් 100,000 යක් පමණ ගෙන ආවේය. නමුත් දෙවියන් වහන්සේගේ අනාගත වක්තෘවරයෙක් පැමිණ මේ දේ කරන්න එපාය කියා පැවසූ විට ඔහු අවංක හදවතින් එය පිළිගනු ලැබුවේය.



***But what about the hundred talents I paid?***

....Contd. to page 6





**ඉතා හදිසි දැනුම් දීමක්!**

ඉදිරියේදී තැපැල් ප්‍රතිරාවය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් ඔබට කිසිඳු බාධාවකින් තොරව තැඳවීමේ ප්‍රතිරාවය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිපියකින්, විද්‍යුත් තැපෑලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙතට ලැබෙන්නට සලස්වන්න.

ඔබගේ සහයෝගය අපට ඔබට හොඳින් සේවය සලසා දීමට උපකාරී වෙයි!

අපගේ ලිපිනය:


**ECHO OF HIS CALL,**
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India
Cell: (+91) 98412 71858 / 98410 71858 Email: [illegible]@echoofhiscall.org

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**පෙබ:19** - අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවාවන් You Tube නාලිකාව හරහා විකාශනය කිරීමට අපිට සහාය වන්නා වූ ඉතා අනර්ඝ මාධ්‍ය කණ්ඩායම නිසා ස්තුති කරන්න.

**පෙබ:20**- අපගේ සේවා හවුල්කරුවන් දක්වන්නා වූ දායකත්වය හා මූල්‍යමය සහයෝගයෙන් අපට ආශිර්වාදය කළ නිසා ස්තුති කරන්න.

**පෙබ:21** - 2026 වර්ෂය සඳහා මාසික දින දර්ශනය හා පොරොන්දු කාඩ් පත් මුද්‍රණය කිරීමටත් ඒවා අවශ්‍ය ස්ථාන වලට යැවීමටත් සම්පූර්ණ අනුග්‍රහය ලබාදුන් නිසා ස්තුති කරන්න.

**පෙබ:22**- තෙහෙමියා බයිබල් විද්‍යාලයේ සහ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලෙහි පැවැත් වූ අපගේ විශේෂ නත්තල් සහ අලුත් අවුරුදු වැඩසටහන් වලට ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

**පෙබ:23** - අපගේ සභාවේ සියළුම ක්‍රියාකාරී වැඩවලට සහභාගී වීමට තරුණ තරුණියන්ට හා දරුවන්ට ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

**පෙබ:24**- අපගේ මාධ්‍ය සේවාවන් වලට කැඳවීමේ ප්‍රතිරාවය youtube නාලිකාව හරහා ළඟා නොවූ බොහෝ ජාතීන් වෙතට ළඟා වීමට ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

**පෙබ:25**- අපගේ ප්‍රධාන පාලකතුමා වන දේවගැති එස්. සැම් සෙල්වරාජ් සහ ඔහුගේ පවුලේ අයව සියළු නපුරු බලවේගයන් ගෙන් ආරක්ෂා කළ නිසා ස්තුති කරන්න.

**පෙබ:26**- අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වලට යහපත් සෞඛ්‍යයක් සහ දිව්‍යමය ආරක්ෂාවක් ලබා දුන් නිසා ස්තුති කරන්න.

**පෙබ:27**- අපගේ ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවන්වල ඉරුදින දේව මෙහෙයන්වලදී දෙවියන්වහන්සේගේ වචනයේ බලය ප්‍රකාශ වූ නිසා ස්තුති කරන්න

**පෙබ:28**- අපගේ මුද්‍රණාලය මගින් භාෂා 16කින් කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට සහ එය සේවා ස්ථාන වෙත යැවීමට අපට හැකියාව ලබා දුන් නිසා ස්තුති කරන්න

**මාර්:01** - ශ්‍රී ලංකා දේශය තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් තුරන් කර එය යහපත් අතට පත්කර තිබෙන නිසා ස්තුති කරන්න.

**මාර්:02**- ශ්‍රී ලංකා දේශය තුළ සිදුවූ ස්වභාවික විපත්තීන් නිසා අවතැන් වූ අයගේ ජීවිත නැවත හයා සිටුවීමට හැකි වූ නිසා ස්තුති කරන්න.

**මාර්:03**- ශ්‍රී ලංකා දේශය තුළ බාධාවකින් තොරව ශුභාරංචිය ප්‍රකාශ කිරීමට දෙවියන් වහන්සේ මනුෂ්‍යයන් නැගිටුවා තිබෙන නිසාත් ඒ සඳහා අවස්ථාවන් ලබා දී තිබෙන නිසාත් ස්තුති කරන්න.

**මාර්:04**- ශ්‍රී ලංකා දේශය තුළ සේවය කරන්නා වූ දේවදාස දාසීන්ගේ පවුල් වලට අවශ්‍ය සියල්ල සැපයීම නිසාත් ඔවුන්ට ලබා දුන් ආරක්ෂාව නිසාත් ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**මාර්:05**- සියලුම කිතුණු දේශකයින් දේව වචනය අපවිත්‍ර නොකර, එය පරිපූර්ණ ලෙස දේශනා කරන පිණිස යාච්ඤා කරන්න

**මාර්:06**- 2026 සිට 2027 අධ්‍යයන වර්ෂය සඳහා අපගේ නේවාසික සහ සන්ධ්‍යා කාලයේදී පවත්වන නෙහෙමියා බයිබල් විද්‍යාලය සඳහා සුදුසුකම් ලත් සිසුන් ඇතුළත් කර ගැනීම පිණිස යාච්ඤා කරන්න.

**මාර්:07**- 2026 සිට 2027 අධ්‍යයන වර්ෂය සඳහා අපගේ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලට නවක සිසුන් ඇතුළත් කර ගැනීම පිණිස යාච්ඤා කරන්න.

**මාර්:08**- සෑම ජාතීන් අතර සිටින සියලුම දරුවන් සහ තරුණ තරුණියන් ජේසුස්වහන්සේව ඔවුන්ගේ පුද්ගලික ගැලවුම්කරුවා ලෙස පිළිගන්නා පිණිස යාච්ඤා කරන්න.

**මාර්:09**- අපගේ සහකාර කර්තෘවරුන් සහ ඔවුන්ගේ පවුල්ව සාමාජිකයින් නිසාත් වෙන්වී නිවාස වල සිටින මව්වරු සහ පියවරුන්ට යහපත් සෞඛ්‍යය තත්වයක් සහ හදවතෙහි සමාදානය තිබෙන පිණිස යාච්ඤා කරන්න.

**මාර්:10**- අපගේ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන්
පාසලේ 10 වන ශ්‍රේණියෙහි ඉගෙනුම් ලබන සිසුන්ට ඔවුන්ගේ අවසාන විභාගයෙන් විශිෂ්ට ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවන පිණිස යාච්ඤා කරන්න.

**මාර්:11**- කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ youtube නාලිකාව හරහා විකාශනය කරන කෙටිකතා තුළින් ළඟා නොවූ පුද්ගලයන් වෙතට ළඟා වීමට හැකිවන පිණිස යාච්ඤා කරන්න.

**මාර්:12**- අපගේ නෙහෙමියා බයිබල් විද්‍යාලයේ සිසුන්ට ඔවුන්ගේ උපාධි ප්‍රධානෝත්සවය සාර්ථකව නිමා කිරීමට හැකිවන පිණිස යාච්ඤා කරන්න.

**මාර්:13**- ලෝකයේ රටවල් අතර පවතින යුද්ධ වලින් එහි සිටින සියලුරම ජනතාවට දිව්‍යමය ආරක්ෂාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**මාර්:14** - ලොව පුරා සිටින්නා වූ සියලුම මිෂනාරි සේවකයින්ට දිව්‍යමය ආරක්ෂාව ලැබෙන පිණිස සහා ඔවුන්ගේ ආර්ථික අවශ්‍යතා වලට දෙවියන් වහන්සේගේ ආශිර්වාදය ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**මාර්:15**- අපගේ ජ්‍යෙෂ්ඨ දේවගැති තුමා වන එස්. සැම් සෙල්වරාජ් සහ ඔහුගේ පවුලේ සාමාජිකයින් සියලුරු ආකාර නපුරු බලවේගයෙන් ආරක්ෂා කරන පිණිස යාච්ඤා කරන්න.

**මාර්:16** - ශ්‍රී ලංකාවේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් සකස් කිරීමේදී එය දරුවන්ට සුදුසු හා නිවැරදි අධ්‍යාපන ක්‍රමයක් ලබාදීමට බලධාරීන්ට ප්‍රඥාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**මාර්:17**- 2026 වන වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ තිබෙන්නාවූ සියලුරම කිතුණු සභාවන් තුළ ආත්මික ලෙස මහා පිබිදීමක් ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**මාර්:18**-- ශ්‍රී ලංකා දේශය තුළ මත්පැන් හා මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී සිටින පාසැල් දරුවන් හා තරුණ තරුණියන් එයින් නිදහස් වී දෙවියන්වහන්සේගේ ප්‍රේමය අත්දැකීමට හැකිවන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

*''එසේ නම් මා ඊශ්‍රායල් සේනාවට දුන් තලෙන්ත සියය ගැන අපි මක්කරමුද?'' (ලේකම් 25:9)*

එයට අනාගත වක්තෘවරයා දුන් පිළිතුර වූයේ:

*''........ ඊට වඩා ඔබට දෙන්ට ස්වාමීන් වහන්සේට පුළුවන.'' (2 ලේකම් 25:9)*

ඔහු මුදල් වියදම් කර තිබුණත් දෙවියන් වහන්සේට කීකරු වීමට තීරණය කළේය. ඔහු දෙවියන්වහන්සේට කීකරු වී සොල්දාදුවන් ආපසු හරවා ඇරියේය.


Amaziah sent the soldiers home

කීකරුවීමට අපි මිලයක් ගෙවන්නට අවශ්‍යය. අකීකරුවීම ඊට වඩා මිලයක් ගෙවන්නට සිදුවෙනු ඇත.

මේ අවස්ථාවේදී අමසියා රජ ඉතා භක්තිවන්ත රජෙක් ලෙස සිටියේය. දෙවියන් වහන්සේට ඔහු ගරු කළේය. දේව වචනය අපට පවසන්නේ ඔහු හරි දේ කළේය. නමුත් මුළු හදවතින් නොවේය.

## C. සම්පූර්ණ යටත් භාවයෙන් තොරව ඔහු හැප වූයේය!

අමසියා රජ නපුරු මුරණ්ඩු පුද්ගලයෙක් නොවේය. ඔහුගේ පිය වූ යෝවාෂ්ව ඔහු අනුගමනය කළේය. නමුත් දාවිත් මෙන් මුළු හදවතින් දෙවියන් වහන්සේව අනුගමනය නොකළේය.


'Shalem' means fully surrendered

ඔහු හොඳින් පටන් ගත්තේය. නමුත් දෙවියන්වහන්සේ බලාපොරොත්තු වන්නේ හොඳින් පටන් ගත් අය නොව හොඳින් අවසන් කරන අයයි. අමසියා හොඳින් පටන් ගත් නමුත් එය මුළු හදවතින් ඉටු නොකළේය.

හෙබ්‍රෙව් වචනයක් වන 'ෂාලම්' යන පදයෙහි තේරුම නම්; 'සම්පූර්ණ කරන්න' නැතිනම් 'මුළුමනින් යටත් වෙන්න' යනුයි.

අමසියාගේ ප්‍රශ්නය වූයේ ඔහු මුළුමනින් යටත් වුවත් මුළුමනින් කීකරු වූයේ නැත. ඔහුගේ ජීවිතය පිටස්තරව දෙවියන් වහන්සේ සමග ජීවත් බව පෙනුන නමුත් ඔහු ඔහුගේ හදවත මුළුමනින්ම දෙවියන් වහන්සේ සමග තිබුණේ නැත.

ප්‍රිය සහෝදරයා සහෝදරිය, ඔබට පුළුවනි:

- ▲ දසයෙන් කොටසදීම
- ▲ විශ්වාසවන්තව සේවය කිරීම
- ▲ හොඳ ජීවිතයක් ගත කිරීම

නමුත් තවත් ඔබගේ ජීවිතයේ උඩඟුකම, සමාව නොදීම, දොස් පැවරීම, සැඟව තිබෙන පාපයන් සහ තමාගේම කැමැත්ත කරන ජීවිතයක් තිබෙනවා නම් එනම් පිටස්තර කීකරුකම තිබෙන නමුත් ඇතුළතින් ඔබ සම්පූර්ණයෙන්ම යටත්කම නොමැති බවයි.

සැම දෙනාගේම ඇතුලාන්තයෙන් මුල් ඇද ඵල දරන අය විය යුතුයි.


One should be deeply rooted and bear fruit upwards

## (2). සම්මුතිය!

### ඔහු අනුමැතියි දුන් දේ ඔහුට විනාශ කළේය.

*(2 ලේකම් 25:11-16)*

*''එසේ වී නමුත් උස්තැන් අහක් නොකරන ලද්දේය .........'' (2 රාජාවලිය 14:4)*

අමසියා ඔහු විසින් විනාශ කළ යුතු දේ විනාශ කළ නමුත් සම්මුතිය පවත් ගත්තේ කුඩා ලෙසයි. ඔහු සැම දේම විනාශ කෙළේ නැත.

## A. ජයග්‍රහණයෙන් පසු උඩඟුකම!

ඒදොම්වරුන්ව පරාජය කළ පසු අමසියා ඔවුන්ගේ රූප ගෙන ඒවාට නමස්කාර කළේය.


Amaziah brought back their idols and worshipped them

*''අමසියා ඒදොම්වරුන් මරා ආවායින් පසු ඔහු සෙයිර් පුත්‍රයන්ගේ දෙවිවරුන් ගෙනැවිත් තමාට දෙවිවරුන් කොට තබාගෙන, ඒවා ඉදිරියෙහි වැඳ වැටී ඒවාට සුවඳ දුම් ඔප්පු කෙළේය.'' (2 ලේකම් 25:14)*

මේ ගැන මොහොතක් සිතන්න:

දෙවියන් වහන්සේ ඔවුන්ට ජයග්‍රහණය දුන්සේක: නමුත්

උඩඟුකම ඇතුළු වූයේය

අවබෝධය නැති විය

සම්මුතිය නැති විය

ඔහු අන් දෙවිවරුන් ඉදිරියෙහි හිස නැමුවේය. මේ ආකාරයට මුලා කිරීම සිදුවිය.

## B. නිවැරදි කිරීම ප්‍රතික්ෂේප කිරීම

පටන් ගැන්මේදී අමශියා නිවැරදි දේ කිරීමට කැමති වූයේය. නමුත් ඔහු තුළට උඩඟුකම පැමිණි විට නිවැරදි දේ කිරීම ප්‍රතික්ෂේප කළේය.

*''.......... තමුන්ගේ සෙනඟ නුඹේ අතින් ගළවා නොගත් සෙනඟගේ දෙවියන් වෙතට මක් නිසා හැරුණෙහිදැයි ඔහුගෙන් ඇසුවේය." (2 ලේකම් 25:15)*

අමශියා ඉතා කෝපයෙන් පිළිතුරු දුන්නේය.

*''නුඹ රජුගේ මන්ත්‍රීයෙකු කොට පත් කෙළෙමුද?......." (2 ලේකම් 25:16)*

ඔහුගේ ක්‍රියා කලාපය කෙතරම් වෙනසක් ඇතිව තිබුණේද ? දෙවියන් වහන්සේ අපව හරි ගැස්සීමට සූදානම් වන විටදී අප ඇහුම්කන් දුන්නේ නැතිනම් අප ගමන් කරන්නේ විනාශය වෙතටයි.

ඔහුට පහසුතාවයක් තිබෙන විටදී ඔහු කීකරු විය. නමුත් දැන් ඔහුට කීකරු වීමට නොහැකි විය. මන්ද දෙවියන්වහන්සේ ඔහුව හරි ගස්සනවාට ඔහු අකමැති විය. සමහරවිට දෙවියන්වහන්සේ අපගේ ජීවිතය හරි ගැස්වීමට යන විටදී අපිද එය ප්‍රතික්ෂේප කරයි . මම ඔබට පවසන කාරණය නම්; උන්වහන්සේට කීකරු වෙන්න කියාය. අප ගන්නා වූ සෑම පියවරකදීම උන්වහන්සේට කීකරු වෙමු.

*''නුඹලා දකුණට හැරෙන විටද නුඹලා වමට හැරෙන විටද: මාර්ගය මේය, මෙහි ඇවිදියල්ලායයි නුඹට පස්සෙන් කියන හඬක් නුඹේ කන් වලට ඇසෙන්නේත් යෙදෙනවා ඇත." (යෙසායා 30:21)*

අප සෑම විටම උන්වහන්සේට ඇලුම්ව උන්වහන්සේට යටත් වී මුළුමනින්ම උන්වහන්සේට කීකරු විය යුතුයි.

## C. සම්මුතිය නිතරම උඩඟුකමට මුරණ්ඩු වීමට සහ අන්ධකමට ගෙන යන්නේය !

සම්මුතියට පැමිණි විට පැමිණෙන ප්‍රතිඵල බොහෝය, එනම්:

- ▲ උඩඟුකම
- ▲ රූප නමස්කාර කිරීම
- ▲ උපදේශනයට ඇහුම්කන් නොදීම
- ▲ තමා මත විශ්වාසය තැබීම
- ▲ අවවාද පිළිනොගැනීම
- ▲ මෝඩ තීරණ ගැනීම

අපගේ කැපවීම සම්පූර්ණ යටත්කම නොමැතිව තිබෙනවා නම්: අප නිතරම සම්මුතියට ඉඩ දෙන්නෙමු.

## (3). ප්‍රතිවිපාක

ඔබ යටහත් වූයේ නැතිනම් එය ඔබට විනාශය ගෙන දෙයි.

(2 ලේකණ 25: 17-28)

## A. දෙවියන් වහන්සේ අනුමත නොකළා වූ යුද්ධය,

අමශියා රජ තමාගේ සාර්ථකත්වය නිසා උඩඟුවී ඊශ්‍රායල් රජතුමාට විරුද්ධව කතාකොට ඔහුට යුද්ධයට පැමිණෙන ලෙස අභියෝග කළේය. දෙවියන්වහන්සේ ඔහු සමඟ සිටියේ නැත.

දෙවියන්වහන්සේ තුළ විශ්වාසය නොතබා ක්‍රියා කිරීම ඉතාම භයානකය. ඔහු ලැබූ සාර්ථකත්වයන් දෙවියන්වහන්සේගේ අනුමැතිය නිසා සිදුවූයේ යැයි කියා ඔහු සිතුවා. ඊශ්‍රායෙල් රජතුමා ඔහුට උපමාවෙන් කතා කරමින් යුද්ධයට එන්න එපාය කියා පැවසුවත් අමශියා එය සැලකුවේ නැත. තමාගේ හදවත දෙවියන්වහන්සේ තුළ සම්පූර්ණයෙන් යටත්ව තිබුණේ නැත. ඔහු අන් අය පවසන උපදෙස් පිළිගැනීමට කැමති වූයේද නැත. එය දෙවියන්වහන්සේ වෙතින් පැමිණුන පුද්ගලයෙකුගේ මාර්ගයෙන් පැමිණුනත් ඔහු එය පිළිගත්තේ නැත.

## B. ප්‍රඥාවන්ත අවවාද ප්‍රතික්ෂේප කිරීම,

අමශියාගේ සතුරන් පවා ඔහුගේ උඩඟුකම දැනගත්තේය.

*''..........නුඹේ සිතද පාරට්ටු කරන පිණිස අහංකාර වී තිබේ. ගෙදර සිටපන්න...." (2 ලේකම් 25:19)*

NEHEMIAH BIBLE COLLEGES,
Chepauk & Santhoshapuram, Velachery Chennai.
Qualification : 10th Standard & above
Rush for admission! Medium :Tamil (Part Time)
Hindi (Residential) (Sponsorship Available)
Diploma in Theology
Recognised by International Christian Leaders & Senior Pastors for the past 56 years
Contact : The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
1969 to 2029 ECHO OF HIS CALL



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

## "...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

## මගේ පහත් තත්වය ගැන ස්වාමීන් වහන්සේ සලකා බැලූ සේක !

*''අපේ පහත් ස්වභාවයෙහිදී අප සිහිකළ උන්වහන්සේට ස්තුතිකරව්; මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතින්නේය." (ගීතාවලිය 136:23)*

මගේ සේවය ආරම්භ කළ මුල් කාලයේදී විදේශ රටක සිටි මගේ මිත්‍රයෙකුගේ පවුල සමඟ ටික කාලයක් නැවතී සිටින්නට අවස්ථාව ලැබුණේය. එම දේශයේදී ඔවුන් මගේ සියලුම අවශ්‍යතාවයන් බලා ගන්නා ලදී.

දිනක් සවස් කාලයේ දී මගේ මිතුයා මගේ කාමරයට පැමිණ මෙසේ පැවසුවේය; ''මට දැනෙනවා ඔබ දෙවියන් වහන්සේට යම් කාරණයක් උදෙසා යාච්ඤා කරන බව, කරුණාකර මට එය පවසන්න පුළුවන්ද?" යනුවෙනි.

මම ඔහුට පිළිතුරු දෙමින්; ''අනෙකුත් මුද්‍රණාලයන් වලට මුද්‍රණ යන්ත්‍රයක් තිබෙනවාක් මෙන් අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ මුද්‍රණ කටයුතු කරගෙන යන පිණිස මුද්‍රණ යන්ත්‍රයක් ලැබෙන පිණිස මම යාච්ඤා කරමි" යි කියා පැවසුවෙමි.

මේ සම්බන්ධව මට මහත් බරක් තිබෙනවා. මේ සඳහා අපට Offset යන්ත්‍රයක් අවශ්‍යයි, මා යාච්ඤා කරන්නේ සම්බන්ධවයි' කියා පැවසුවෙමි.

පසු දින මා එම නිවසෙන් පිටතව යන විට මගේ මිතුයා සහ ඔහුගේ භාර්යාව මා ළඟට පැමිණ ලිය කියවිලි වගයක් පෙන්වා; ''අපගේ නිවස බැංකුවට තබා එම මුදල ඔබගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවය සම්පූර්ණ ලෙස කරගෙන යාම දැකීමට අප කැමැත්තෙන් සිටිමි"යි කියා පැවසුවේය.

එවිට මා ඉතා කලබලයට පත් වී; 'ඔබ මෙසේ බැංකුවෙන් ණයට ගෙන මට දෙන මුදලට මා කැමති නැහැ' කියා පවසමින් එය ප්‍රතික්ෂේප කළෙමි.

එම පවුලේ අය මගේ ක්‍රියාව දැක පුදුමයට පත් වී පවසනු ලැබුවේ; 'මේ ලෝකයේ ජීවත් වන්නට නොදන්න පුද්ගලයෙක්ය' කියාය. ඔවුන් දිගටම එම මුදල ලබාගන්නා පිණිස මාව පෙළඹුවේය. නමුත්, 'ඔබ ණයට දෙන මුදල මා භාර ගන්නේ නැත'කියා මා ප්‍රකාශ කළෙමි. එනමුත් මා එම කාරණය උදෙසා දිගටම යාච්ඤා කළෙමි.

නැවත මා ඉන්දියාවට පැමිණුනෙමි. එවිට ඉන්දියාවෙහි සිටින මගේ දුප්පත් මිතුරන් සෑම දෙනාම එකතු වී මුදල් එකතු කළ අතර පසුව අප අලුත්ම නවීන පන්නයේ මුද්‍රණ යන්ත්‍රයක් ලබාගත්තේය.

*ස්වාමීන්වහන්සේ යහපත් බව රස බලා දැනගන්න. (ගීතාවලිය 34:8) දෙවියන් වහන්සේගේ කරුණාව මාව නිතරම දරා ගත්තේය. හිතෝපදේශ 28:20 හි මෙසේ පවසා ඇත; ''විශ්වාස මනුෂ්‍යයෙකුට බොහෝ ආශිර්වාද ලැබේ ......"*

කැඳවීමේ ප්‍රතිරාවය සේවයට ස්ථිර ආදායමක් නොමැති වුවත් දෙවියන්වහන්සේ අපගේ සියලු අවශ්‍යතාම නිරන්තරයෙන්ම අපට සපයයි. සියලු ගෞරවය හා ප්‍රශංසාව දෙවියන් වහන්සේට වේවා! ආමෙන්.

*************

**NOTICE**

Save our mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (main numbers) in your mobile phones. - Editor

උඩඟුකම පැමිණි විට අපගේ ඇස් අන්ධ වෙයි. සත්‍ය වූ දේ අපට නොපෙනෙයි. අප කාගෙන්වත් උපදෙස් නොගනියි. දෙවියන් වහන්සේ අපගේ මෝඩකම ඉවත් කර එයින් බේරාගන්න පිණිස යාඥා කරමු.

## C. අමශියාගේ සම්පූර්ණ වැටීම.

අමශියාගේ වැනෙන ස්වභාවය නිසාඃ ඔහුගේ හමුදාව පරාජයට පත්විය.



*Jerusalem's wall was broken*

## MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines :English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikaans.
3. **BIBLECOR** - Basic Bible Courses (English, Tamil & Hindi)
4. Theological Correspondence Courses: English & Tamil
5. Nehemiah Bible Colleges (Chepauk, Santhoshapuram & Velachery)
6. Branch Churches: Santhoshapuram, Balaji Nagar & Velachery
7. Great Commission Partners (Network of Pastors)
8. Training Programmes – Seminars & Retreats
9. Crusades
10. Literature Distribution and Follow Up
11. Gospel Printing Press - Publications
12. St. Paul's Matriculation School - Village English High School
13. Sunday Schools (Chepauk) : 10.30 a.m. Sunday & (Velachery, Balaji Nagar & Santhoshapuram) 3.00 p.m. Sunday
14. **Early Morning Service : 5.30 a.m. Sunday**
15. **Preliminary Service : 8.00 a.m. Sunday**
16. **Tamil Service : 8.30 a.m. Sunday**
17. **Youth Meeting : 11.00 a.m. Sunday**
18. **Fellowship Lunch : 1.00 p.m. Sunday**
19. **Telugu Service : 4.00 p.m. Sunday**
20. **Hindi Service : 5.00 p.m. Sunday**
21. **Tamil & English Service : 6.00 p.m. Sunday**
22. Feedback Time : 7.30 p.m. Sunday
23. Women's Prayer : 5.30 p.m. Wednesday
24. Hindi Prayer : 7.00 p.m. Wednesday
25. Men's Prayer : 7.30 p.m. Friday
26. Discipleship Meeting : 6.00 p.m. Saturday
27. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
28. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
29. Ministers' Meeting : 5.30 p.m. First Saturday
30. Parents' Prayer : 4.00 p.m. First Sunday
31. Night Prayer : 9.30 p.m. Third Friday
32. Fasting Prayer : 9:30 a.m. Second Saturday
33. Holy Communion : Second Sunday Service
34. Youth / Kid Prayer : 10.00 p.m. daily (over phone)
35. Staff Devotion : 9.00 a.m. daily
36. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

යෙරුසලමේ පවුරු කඩා දැමීම දේව මාලිගාව විනාශ කිරීම ඔහුව අත් අඩංගුවට ගැනීම ඔහුගේ ජීවිතය ලැජ්ජාවෙන් අවසන් විය

ඔහුගේ ආරම්භය කැපවීමෙන් පටන්ගත් මනුෂ්‍යයා සම්පූර්ණයෙන් ම විනාශයෙන් අවසන් වූයේය.

*ඇයි ?*

මක්නිසාද ඔහු හරි දේ කළේය - නමුත් එය මුළු හදවතින්ම නොකළේය.

කුඩා සම්මුතිය අපගේ ජීවිතයේ විශාල විනාශයකට ඉඩ දෙයි.

අවසාන ආරාධනාව: සම්පූර්ණ යටත්කම තෝරාගන්න!

ප්‍රිය මිතුවරුනි, දෙවියන්වහන්සේ බලාපොරොත්තු වන්නේ අපගේ ජීවිතයේ සම්පූර්ණකමයි. එමෙන්ම උන්වහන්සේගේ බලාපොරොත්තුව අප

### මුළු හදවතින්ම උන්වහන්සේට කැපවීමයි.

කැපවීම හොඳයි,
භාගයට කැපවී යටත්වීම භයානකයි
සම්මුතිය දිගටම වර්ධනය වීමට පටන් ගනියි.
ප්‍රතිවිපාකය පිටුපසින් පැමිණෙයි

අප විශ්වාසයෙන් යුක්තව නැගී සිටින පිණිස උන්වහන්සේ අපගේ වේදනාවන් දරා ගත් සේක.

Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

උන්වහන්සේ අපගේ පාපයත් ශාපයත් තුළින් අපට නිදහස දෙමින් හා අපට ආශීර්වාද කරමින් අපගේ ජීවිතය මුළුමනින්ම වෙනස් කළේය.

මෙම නව වසර ඔබට ජයග්‍රාහිකව අහිමි වූ සෑම දේම ලැබෙන්නා වූ වසරක් වේවා!

ප්‍රේමවන්තයෙනි, 2026 වන වසර ඔබට තිබෙන දේවල් දැක ගන්න වසරක් පමණක් නොවන්නේය.

සතුරා ඔබගෙන් සොරා ගත් සියල්ල නැවත අත්පත් කරගන්නා වූ වසරක්ය.

ඔබට ලැබුණා වූ ස්ථානය ඔබ නැවත ලබාගෙන ප්‍රීතියෙන් යුතුව කැඩුනාවූ බිඳුනා වූ ඔබගේ ජීවිතය නැවත ලබා ලබාගන්නාවූ වසරක් වීමට,

**දාවිත් මෙන් ඔබත් ;**

දෙවියන්වහන්සේට ප්‍රමුඛස්ථානය දෙන්න.
දේව රාජ්‍යයේ මානසිකත්වය තුළ ජීවත් වෙන්න.
ඔබ ළඟ තිබෙන සෑම දේ තුළින්ම දෙවියන් වහන්සේට ගරු කරන්න.

එවිට ඔබ දෙවියන්වහන්සේගේ අනුග්‍රහයත් ජයග්‍රහණයත් ඔබගේ ජීවිතයේ සෑම අවස්ථාවේදීම අත්දකිනු ඇත. දාවිත් ගිය ගිය සෑම ස්ථානයෙහිදීම දෙවියන්වහන්සේ ඔහුට ජයග්‍රහණය ගෙන දුන්නේය.

*"......දාවිත් ගිය ගිය තැනදී ස්වාමීන් වහන්සේ ඔහුට ජය දුන් සේක" (2 සාමුවෙල් 8:6)*

2026 වන වසරේදී මෙය ඔබගේ සාක්ෂියක් වේවා! ඔබ යන්නා වූ සෑම ස්ථානයේදීම දෙවියන්වහන්සේ ඔබට ජයග්‍රහණය දෙමින් ඔබ සමඟ සිටින සේක.

පරාජයට පත් වුණා වූ හිය ඇති වූ සෑම ස්ථානයේදීම ඔබ සැබැවින්ම ඇදහිල්ලේ වීරයෙක් වෙන්නේ කියා ප්‍රාර්ථනා කරන්නෙමු!

දෙවියන්වහන්සේ ඔබට ආශීර්වාද කරන සේක! ඔබට ඉතාම ජයග්‍රාහී වසරක් වේවා!

************

# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :
ECHO OF HIS CALL
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS Patrika Channel"**
**on 2nd FEBRUARY 2026.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
P.O. Box No. 2957,
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**